REMOVED
FROM THE
LIBRARY

# ශ්‍රී ලංකාවේ ගුරු අධ්‍යාපන ආයතනවල කෙරෙන ඇගයීම් කටයුතු පිළිබඳ විචාරාත්මක විමර්ශනයක්

අධ්‍යාපන දර්ශනපති උපාධිය

අධ්‍යාපන පීඨය
කොළඹ මණ්ඩපය
ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය.

එස්.ඩී.ලයනල් බී.ඒ., අධ්‍යාපන ඩිප්ලෝමා (ලංකා)

UNIVERSITY OF CEYLON
LIBRARY
COLOMBO.

1978.10.04

UCLIB
371544

371544

## සංක්ෂේපයෙන්

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතියේ ප්‍රාථමික හා ද්විතියික පාසැල්වලට අවශ්‍ය ගුරුවර ගුරුවරියන් සඳහා වෘත්තීය අධ්‍යාපනය ලබා දෙන ආයතන වන ගුරු විද්‍යාලවල ක්‍රියාත්මක වන ආරම්භක සූදානම් කිරීමේ ගුරු අධ්‍යාපන පාඨමාලා ආශ්‍රිත ඇගයීම් කටයුතු මෙම පර්යේෂණයට විෂය ක්ෂේත්‍රය වී ඇත. පර්යේෂණ-වලින් අල්ප මෙරට ගුරු අධ්‍යාපන ක්ෂේත්‍රයේ විධිමත් පර්යේෂණවලින් පෝෂණය ලැබිය යුතු ගුරු අධ්‍යාපන ආයතනවල වර්තමානයේ ක්‍රියාත්මක කෙරෙන අභ්‍යන්තර හා බාහිර ඇගයීම් කටයුතු විමසා බැලීමත්, එම ඇගයීම් කටයුතුවල සාර්ථකත්වය හා දුර්වලතා වර්තමානයේ පිළිගත් මත අනුසාරයෙන් විමර්ශනය කිරීම හා ඵලදායී ගුරු අධ්‍යාපනයක් සඳහා වර්ධනය කරගත යුතු ඇගයීම් පද්ධතියක් පිළිබඳ විචාරාත්මක විමර්ශනයක් කිරීම පර්යේෂණයේ අභිමතාර්ථය වේ.

අදාල දත්ත රැස් කර ගැනීම සඳහා ප්‍රශ්නාවලී, සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණ, පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා ලකුණු සංඛ්‍යා විද්‍යාත්මක විශ්ලේෂණය මෙන් ම ලිපි ලේඛන මූලාශ්‍ර උපයෝගී කරගන්නා ලදි. පළමුවන හා දෙවන පරිච්ඡේදවලින් මෙරට වර්තමාන ගුරු අධ්‍යාපන ක්‍රමයේ සුවිශේෂ ලක්ෂණ හා ඇගයීම් කටයුතු සංවිධානය වී ඇති ආකාරය පිළිබඳව අවධානය යොමු කොට ඇත. තෙවන පරිච්ඡේද-යෙන් ශ්‍රී ලංකාවේ වත්මන් ගුරු අධ්‍යාපන පාඨමාලා ආශ්‍රිතව පළ වී ඇති අරමුණු විශ්ලේෂණය කර ඒවායේ ඵලදායකබව පිළිබඳ විචාරාත්මක විමර්ශනයත්, පරිපූර්ණ පරමාර්ථ හා අරමුණු ප්‍රකාශනයක් සම්පාදනය සඳහා ගත හැකි පිළිගත් ක්‍රියා මාර්ගයන් මොනවා ද යන්නත් විමසා ඇත. මෙහි දී දැනට පළ වී ඇති ව්‍යාකූල අරමුණු ප්‍රකාශනය නිරවුල් කරගෙන එහි ඇතුළත් අංග පදනම් කොට පුළුල් පරමාර්ථ හා සමස්ත අරමුණු සම්පාදනයට පියවර ගන්නා ලදි. නිබන්ධනයේ සිව්වන පරිච්ඡේදයෙන් විෂයමාලා සංවර්ධන ක්‍රියාමාර්ගයන් තුළින් ඇගයීම් කටයුතු සැලසුම් කිරීම පිළිබඳව සැලකිල්ල යොමු කොට ඇත.

මෙරට ගුරු අධ්‍යාපන පාඨමාලාශ්‍රිත ඇගයීම් කටයුතු අභ්‍යන්තර හා බාහිර වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදිය හැකිය. නිබන්ධනයේ 5, 6 හා 7 යන පරිච්ඡේදවලින් මේවා විචාරාත්මක ව විමර්ශනය කරන ලදි. අභ්‍යන්තර ඇගයීම්වලට ලිඛිත වාර පරීක්ෂණ, ප්‍රායෝගික පරීක්ෂණ, ව්‍යාපෘති ඇගයීම් හා ඉගැන්වීමේ පරිචය ඇගයීම් ඇතුළත්ය. බාහිර ඇගයීම් වශයෙන් හැඳින්වෙනුයේ විභාග දෙපාර්තමේන්තුව මගින් පාඨමාලා අවසානයේ පැවැත්වෙන ලිඛිත පරීක්ෂණයයි. යථෝක්ත සෑම ඇගයීම් ක්‍රියාමාර්ගයකම වලංගුතාව විශ්වසනීයතාව හා ප්‍රායෝගිකබව විමසිල්ලට ලක් කර ඇත.

පර්යේෂණයෙන් එළඹිය හැකි නිගමනවලින් අනාවරණය වන්නේ, ඵලදායි ගුරු අධ්‍යාපන පද්ධතියක වර්ධනය සඳහා අවශ්‍ය වලංගුතාවකින් හා විශ්වසනීයතාවකින් සමන්විත විධිමත් ඇගයීම් පද්ධතියක්, අපේක්ෂිත මට්ටමින් විකාශනය වී නොමැති බවය. එවැන්නක් ගොඩනැඟීම සඳහා ක්‍රියාත්මක කළ හැකි යෝජනා නිබන්ධනයේ අවසාන පරිච්ඡේදයෙන් සමාලෝචනය කර ඇත.